# රාජ්‍ය ළමා චිත්‍ර උළෙල - 2021

දේශීය ළමා සිත්තරුන්ගේ මහා මෞලි මංගල්‍යය ලෙස හැඳින්වෙන රාජ්‍ය ළමා චිත්‍ර උළෙල සඳහා උතුරු නැගෙනහිර ඇතුළු දිවයිනේ සෑම පළාතක්ම නියෝජනය කරමින් වාර්ෂිකව අයදුම්පත් කැඳවනු ලැබේ.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය දෘශ්‍ය කලා උපදේශක සභාව මගින් සංවිධානය කරනු ලබන “2021- රාජ්‍ය ළමා චිත්‍ර උළෙල” සඳහා නිර්මාණ භාරගැනීම 2021 ජනවාරි මස 25 වෙනි දින සිට මාර්තු මස 31 වෙනි දින දක්වා කොළඹ 07 ජාතික කලාභවනේදී සිදුකිරීමට නියමිතය.

එසේ ලැබෙන චිත්‍ර අතරින් එක් දිස්ත්‍රික්කයකින් නිර්මාණ 150 බැගින් තෝරා එම නිර්මාණකරුවන් දෙවන වටයේ තරග සඳහා ඉදිරිපත් කරනු ලැබේ. දෙවන වටයේ තරග දිස්ත්‍රික්ක මට්ටමින් විශේෂ වැඩමුළුවක්ද සහිතව පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. පළමු වටයේ ජයග්‍රාහකයින් සියලු දෙනා වෙත එදින සහතික පත්‍රයක් ද ලබාදීමට නියමිතය. දෙවන වටයේදී අඳිනු ලබන චිත්‍ර අතරින් තෝරාගන්නා නිර්මාණ “2021 - රාජ්‍ය ළමා චිත්‍ර උළෙල” අවසාන වටය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර එහිදී ජයග්‍රහණය කරනු ලබන ළමා සිත්තරුන් වෙත සම්මාන ,සහතිකපත් හා මුදල් ත්‍යාග ප්‍රදානය කරනු ලැබේ.

## <u>තරග අංශ</u>

| තරග අංශය | වයස් කාණ්ඩය | | උපන් වර්ෂය |
|---|---|---|---|
| 1. ප්‍රාථමික අංශය | අවුරුදු | 05 – 06 | 2015 - 2014 |
| 2. පශ්චාත් ප්‍රාථමික අංශය | අවුරුදු | 07 – 09 | 2013 – 2012 - 2011 |
| 3. කනිෂ්ඨ අංශය | අවුරුදු | 10 – 12 | 2010 – 2009 - 2008 |
| 4. ජ්‍යෙෂ්ඨ අංශය | අවුරුදු | 13 – 15 | 2007 – 2006 - 2005 |
| 5. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය | අවුරුදු | 16 – 18 | 2004 – 2003 - 2002 |

සෑම තරග අංශයක් සඳහාම පහත සඳහන් පරිදි සම්මාන, සහතිකපත්‍ර සහ මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ.

- ප්‍රථම ස්ථානය - රු 25,000.00
- දෙවන ස්ථානය - රු 20,000.00
- තුන්වන ස්ථානය - රු 15,000.00

විශිෂ්ට සම්මාන 10 යි - රු 7500.00 (එක් අයෙකුට)

කුසලතා සම්මාන 10 යි -රු 5000.00(එක් අයෙකුට)

විශේෂ සහතික 30 යි

<u>තරඟ කොන්දේසි</u>

1. ඔබ කැමති ඕනෑම තේමාවක් සිතුවමට නැගිය හැකිය. ඔබ තෝරාගත් මාතෘකාව චිත්‍රයේ පිටුපස හා අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුයි.
2. ඔබ කැමති ඕනෑම මාධ්‍යයක් චිත්‍ර ඇඳීමට භාවිත කළ හැකිය.
3. චිත්‍රය අඟල් 18×14 ප්‍රමාණය විය යුතුය.
4. එක් අයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
5. චිත්‍ර නිර්මාණය ඉදිරිපත් කළ හැක්කේ ඔබගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයෙන් පමණි.
6. එවනු ලබන නිර්මාණය මීට පෙර වෙනත් තරගයකට ඉදිරිපත් නොකළ එකක් විය යුතුය.
7. නිවැරදිව, පැහැදිලිව සම්පූර්ණ කරන ලද අයදුම්පත චිත්‍රයේ පිටුපස නොගැලවනසේ ඇලවිය යුතුය.
8. තරග කොන්දේසි සම්පූර්ණ කර නොමැති නිර්මාණ සහ ඉල්ලුම් කර ඇති තොරතුරු නිවැරදිව සඳහන් නොවන නිර්මාණ තරගයෙන් ඉවත් කෙරෙනු ඇත.
9. ඔබ විසින් එවනු ලබන චිත්‍ර නිර්මාණය නැවත භාරදෙනු නොලැබේ.
10. ඔබ විසින් එවනු ලබන නිර්මාණ ප්‍රවීණ විනිසුරු මණ්ඩලයකට ඉදිරිපත්කර එයින් තෝරාගන්නා ළමුන් පමණක් අදාළ දිස්ත්‍රික් තරගය සඳහා තෝරාගන්නා අතර, තරග පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය පසුව දැනුම්දෙනු ඇත.
11. විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

චිත්‍ර නිර්මාණ එවිය යුතු ලිපිනය:- ස්ථානභාර නිලධාරි,
ජාතික කලාභවන,
ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ - 07

චිත්‍ර එවනු ලබන ලියුම් කවරයේ හෝ පාර්සලයේ ඉහළ වම් කෙළවරේ "රාජ්‍ය ළමා චිත්‍ර තරගය - 2021" ලෙස සඳහන් කළ යුතුය.

තරණි අනෝජා ගමගේ
අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**විමසීම්:- ලේකම්, රාජ්‍ය දෘශ්‍ය කලා උපදේශක සභාව : 0112882551 / 0112872031**

වැඩි විස්තර දිවයිනේ සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංස්කෘතික නිලධාරින් මගින් සහ <u>Department of Cultural Affairs</u> face book එකට පිවිසීමෙන් ලබාගත හැක.

# රාජ්‍ය ළමා චිත්‍ර උළෙල - 2021

## අයදුම්පත්‍රය

- සම්පූර්ණ නම:-.........................................................................................
- මුලකුරු සමග නම:-.....................................................................................
- උපන් දිනය:-.............................................................................................
- 2020.12.31 දිනට වයස:-...........................................................................
- තරග අංශය:-.............................................................................................
- මාතෘකාව :-.............................................................................................
- පෞද්ගලික ලිපිනය:-..................................................................................
- ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:-...........................................................................
- දුරකථන අංකය:-.......................................................................................

පසු පිටේ ඇති නිර්මාණය මගේම බව සහතික කරමි.

...........................................

අයදුම්කරුගේ අත්සන